සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ගිණුම්කරණය - I

13 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

<u>උපදෙස්:-</u>

- **ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා නිවැරදි පිළිතුරේ අංකය තෝරා තිත් ඉරි මත ලියන්න.**
- **අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.**
- **සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.**

---

(01) කේවල ස්වාමී ව්‍යාපාරයක් වූ වික්‍රමාරච්චි ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කීපයක් පහතින් දැක්වේ.

(i) රු. 50,000 කට ලකුණු කළ මිල වූ භාණ්ඩ 10% ක වට්ටමක් යටතේ රු. 20,000 ක් ගෙවා ගැනීම.

(ii) පිරිවැය රු. 20,000 ක භාණ්ඩ රු. 30,000 කට ණයට විකිණීම.

(iii) රු. 60,000 ක මුදල් සහ රු. 40,000 ක ලී බඩු ප්‍රාග්ධනය ලෙස යෙදීම.

ඉහත ගණුදෙනු සමීකරණයට ගැලපූ විට නිවැරදි ගිණුම්කරණ සමීකරණය වන්නේ,

	ස්කන්ධය		වගකීම්		වත්කම්
	රු.		රු.		රු.
(1)	110,000		25,000	=	135,000
(2)	110,000	+	25,000	=	75,000
(3)	+ 100,000	+	25,000	=	+ 75,000
(4)	+ 110,000	+	25,000	=	+ 135,000
(5)	+ 100,000	+	25,000	=	+ 125,000

(......)

(02) යොනාල්ගේ ව්‍යාපාරයට ලැබුණු ඉන්වොයිසියක දත්ත පහත දැක්වේ.

සීමිත සුරංගි සමාගම ඉන්වොයිසිය	
ඩෙනිම් 10 (එකක් රු. 3,000 බැගින්)	30,000
සාරි 20 (එකක් රු. 1,000 බැගින්)	20,000
	50,000
<u>අඩුකළා</u> වට්ටම් 10%	5,000
	45,000
<u>එකතුකළා</u> (VAT) 11%	4,950
	49,950

ඩෙනිම් 2 ක් පළුදු වී තිබීම නිසා ආපසු යවා තිබේ. සියළු එකතු කළ අගය මත බදු අයකළ හැකි වේ. ඉහත ගණුදෙනු පිළිබඳ නිවැරදි වන්නේ,

(1) ගැණුම් ගිණුමට රු. 50,000 ක් හර කළ යුතුය.

(2) ලද වට්ටම් ගිණුමට බැර කළ යුතු අගය රු. 5,000 කි.

(3) අයවිය යුතු වැට් (VAT) අගය රු. 4,950 කි.

(4) ණයහිමියාට ගෙවිය යුතු අගය රු. 43,956 කි.

(5) ගැණුම් ගිණුමට රු. 49,950 ක් හර කළ යුතුය. (......)

(03) සල් ගහ යට ව්‍යාපාරය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉදිරියට ගෙවන ලද වියදම් රු. 12,500 ක් නොසලකා ඇති අතර අවසාන තොගය රු. 15,000 ක් අධි ගණනය කොට ඇත. මෙමගින් සල්ගහ යට ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රතිඵලයට වන බලපෑම වනුයේ,

(1) ශුද්ධ ලාභය රු. 2,500 කින් අවතක්සේරු වී ඇත.

(2) ශුද්ධ ලාභය රු. 15,000 කින් අධිතක්සේරු වී ඇත.

(3) ශුද්ධ ලාභය රු. 15,000 කින් අවතක්සේරු වී ඇත.

(4) ශුද්ධ ලාභය රු. 27,500 කින් අධිතක්සේරු වී ඇත.

(5) ශුද්ධ ලාභය රු. 2,500 කින් අධිතක්සේරු වී ඇත. (......)

(04) යාරිස් නිෂ්පාදන වෙළඳ ව්‍යාපාරයේ භාවිතා කරන අමුද්‍රව්‍ය අයිතම වලට අදාළව පහත තොරතුරු සපයා ඇත.

තොග අයිතම	ඉතිරි තොග ඒකක ගණන	ඒකක පිරිවැය (රු.)	ඇස්තමේන්තුගත විකුණුම් මිල (රු.)	ඇස්තමේන්තුගත විකුණුම් වියදම (රු.)
X	1500	10	15	3
Y	1200	12	15	8
Z	2400	15	25	10

LKAS 02 අනුව අවසාන තොගය වනුයේ,

(1) රු. 65,400 (2) රු. 100,500 (3) රු. 59,200 (4) රු. 58,600 (5) රු. 59,400 (......)

(05) ලංකා සමාගම කල්බදු ක්‍රමය යටතේ තරිඳු සමාගමෙන් යන්ත්‍රයක් 2014 ජනවාරි 01 දින මිලදී ගන්නා ලදී. ගිවිසුමට අදාළ කොන්දේසි,

- ගිවිසුමට අදාළ යන්ත්‍රයේ සාධාරණ වෙළඳපළ අගය රු. 650,000.
- මූලික ගෙවීම රු. 250,000
- වාර්ෂික කල්බදු වාරිකය රු. 160,000 වන අතර 20141231 දින සිට කල්බදු පොළිය ද ඇතුළත් වේ.
- කල්බදු ගිවිසුමේ කාලය වසර 04 කි. වාර්ෂික කල්බදු පොළිය 20% කි.

2014 වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ගලපන ලද කල්බදු පොළිය සහ 20141231 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් සහ ජංගම නොවන වගකීම්,

	කල්බදු පොළිය (රු.)	ජංගම වගකීම් (රු.)	ජංගම නොවන වගකීම් (රු.)
(1)	80,000	160,000	80,000
(2)	130,000	96,000	224,000
(3)	80,000	96,000	224,000
(4)	80,000	160,000	160,000
(5)	48,000	96,000	224,000

(......)

(06) ලෝචනා සමාගම 2012 ජනවාරි 01 වන දින රු. 850,000 කට යන්ත්‍රයක් මිලදී ගත් අතර එහි ඵලදායී ජීව කාලය අවුරුදු 05 ක් ලෙසත්, සුන්බුන් වටිනාකම රු. 28,125 ක් ලෙසත් ඇස්තමේන්තු ගත කරන ලදී.

යන්ත්‍රයට අදාළ පහත සඳහන් තොරතුරු ඇත.

- සමාගම යන්ත්‍ර හීනවන ශේෂ ක්‍රමය යටතේ වර්ෂයකට 25% බැගින් වර්ෂ 02 ක් ක්ෂය කරන ලදී.
- දෙවන වර්ෂය අවසානයේ දී සමාගමේ ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කර තුන්වන වසරේ සිට සරල මාර්ග ක්ෂය ක්‍රමය හඳුන්වා දෙන ලදී.
- තුන්වන වර්ෂයට අදාළ ආදායම් ප්‍රකාශයට මාරු කරන වාර්ෂික ක්ෂය ප්‍රමාණය වන්නේ.

(1) රු. 150,000 (2) රු. 159,375 (3) රු. 154,101 (4) රු. 188,333 (5) රු. 165,000 (......)

(07) පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කුමක් ද?

A වගකීම් පහළ යාමක් මගින් ආදායමක් ජනිත විය හැකිය.

B වත්කමක් ඉහළ යාමක් මගින් ආදායමක් ජනිත විය හැකිය.

C මුදල් ගලා යාමක් මගින් වියදමක් ඇතිවිය හැකිය.

D වත්කමක් ඉහළ යාමක් මගින් වියදමක් ඇතිවිය හැකිය.

(1) A හා B පමණි (2) B හා D පමණි (3) A, B හා C පමණි

(4) B, C හා D පමණි (5) C හා D පමණි (......)

- **ප්‍රශ්න අංක 08 සහ 09 ට පිළිතුරු සැපයීමේ දී පහත තොරතුරු සැලකිල්ලට ගන්න.**

සීමිත DNA සමාගම 2015 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම සමාන නොවීය. වෙනස අවිනිශ්චිත ගිණුමට මාරු කර සමාගම අවසාන ගිණුම් පිළියෙල කළ අතර, දළ ලාභය හා ශුද්ධ ලාභය පිළිවෙලින් රු. 146,000 හා රු. 125,000 ක් විය.

පසුව කරන ලද පරීක්ෂණයකදී පහත සඳහන් වැරදි සොයා ගන්නා ලදී.

- රු. 2,800 ක් වූ විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජ'නලයේ සටහන්ව නොමැත.
- බොල් ණය කපාහැරීම රු. 5,200 සටහන්ව ඇත්තේ ණයගැති ගිණුමේ පමණි.
- ගැනුම් ජ'නලයේ එකතුව වූ රු. 8,900 ගැණුම් ගිණුමට රු. 9,800 ක් ලෙස පිටපත්ව තිබිණි.
- අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 10,000 පොත්වල සටහන් වී ඇත.
- රු. 1,400 ක දුන් වට්ටම් ලද වට්ටම් ගිණුමේ බැරට සටහන් වී ඇත.

(08) ශේෂ පිරික්සුමෙන් අවිනිශ්චිත ගිණුමට මාරු කළ ශේෂය වනුයේ,

(1) රු. 7,100 හර (2) රු. 4,800 හර (3) රු. 4,800 බැර

(4) රු. 2,400 හර (5) රු. 2,400 බැර (......)

(09) අදාළ ගැලපීම් කිරීමෙන් පසු ව්‍යාපාරයෙන් දළ ලාභය හා ශුද්ධ ලාභය වනුයේ,

	දළ ලාභය (රු.)	ශුද්ධ ලාභය (රු.)
(1)	151,700	127,700
(2)	151,700	126,800
(3)	148,800	182,900
(4)	167,000	132,300
(5)	ඉහත කිසිවක් නොවේ.	ඉහත කිසිවක් නොවේ.

(......)

(10) 2010 වර්ෂයේ දී මිළදීගත් ඉඩමක් එහි ප්‍රත්‍යාගණන අගය වූ රු. 3,000,000 කට 2015 මාර්තු 31 දිනට මූල්‍යතත්ව ප්‍රකාශයේ දැක්වීම තුළින් කඩවන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1) ඒකක සංකල්පය (2) අඛණ්ඩ පැවැත්ම (3) යථානුරූපී බව

(4) ප්‍රමාණාත්මතාවය (5) ඓතිහාසික පිරිවැය (......)

(11) සීමිත පොදු සමාගමක මූල්‍ය ප්‍රකාශන තුළ අඩමාන ණය වෙන්කිරීම ලෙස රු. 150,000 ක් ඇතුළත් කර ඇත. මෙම ගැලපීම පදනම් වී ඇත්තේ කුමන ගිණුම්කරන සංකල්පයක් අනුව ද?

(1) ඓතිහාසික පිරිවැය (2) උපලබ්ධි (3) ආරක්ෂණය

(4) ප්‍රමාණාත්මතාවය (5) ඒකාකාරී (......)

(12) සීමාසහිත පැනෝරා සමාගමේ පහත සඳහන් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශ උද්ධෘතය උපුටා ගන්නා ලදී.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය					
	සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	පොදු සංචිතය	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවා ගත් ලාභ	එකතුව
ආරම්භක ශේෂය	2,400	1,200	800	700	5,100
අවසාන ශේෂය	5,400	100		1,100	6,100

කාලච්ඡේදයේ ලාභය රු. 1,000,000 ක් නම් හා රු. 300,000 ක් පොදු සංචිතයට වර්ෂය තුළ මාරු කළේ නම් ලාභාංශ බෙදාදීමක් සිදු නොවුනි.

ප්‍රසාද නිකුතුවේ වටිනාකම කොපමණ ද?

(1) රු. 3,000,000 (2) රු. 2,500,000 (3) රු. 2,800,000

(4) රු. 800,000 (5) රු. 1,900,000 (......)

- හවුල් ව්‍යාපාරයක 2014/03/31 හා 2015/03/31 දිනට අනාවරණය කරගත් තොරතුරු පහත දැක්වේ.

අයිතමය		2013/03/31	2014/03/31
ප්‍රාග්ධනය	තිලාන්	1,500	1,800
	මිලාන්	1,000	1,200
ජංගම ගිණුම	තිලාන්	300 බැර	500 බැර
	මිලාන්	100 හර	200 බැර
මුළු වත්කම්		3,500	4,500

(13) 2015/03/31 දිනට මුළු වගකීම කීයද?

(1) රු. 3,500,000 (2) රු. 800,000 (3) රු. 2,700,000

(4) රු. 2,900,000 (5) රු. 1,000,000 (......)

(14) 2015/03/31 න් අවසන් වර්ෂයේ මුළු හිමිකම් කීයද?

(1) රු. 300,000 (2) රු. 4,500,000 (3) රු. 3,700,000

(4) රු. 900,000 (5) රු. 7,500,000 (......)

(15) ව්‍යාපාරයක වත්කම් වඩාත් හොඳින් මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය වීමට නම්, එහි තාත්වික වෙළඳපොළ අගය පොත්වල දැක්වීම අවශ්‍යයි. මේ තුළින් ආරක්ෂාවන විඥාපන ගුණාංගය කුමක් ද? නමුත් මේ තුළින් කඩවන සංකල්පය කුමක් ද?

(1) සත්‍යාපනය කළ හැකි බව, ගැලපුම්

(2) අදාළ බව, ගැලපීම්

(3) අදාළ බව, ඓතිහාසික පිරිවැය

(4) අදාළ බව, අඛණ්ඩ පැවැත්ම

(5) සත්‍යාපනය කළ හැකි බව, ඓතිහාසික පිරිවැය (......)

(16) කිසියම් ව්‍යාපාරයක 2014/04/01 තොගය රු. 100,000 ක් විය. 2014/09/30 දින දක්වා ගැණුම් රු. 340,000 වූ අතර, එදින දක්වා විකුණුම් රු. 500,000 කි. දළ ලාභ අනුපාතය විකුණුම් මත 20% කි. මෙම ව්‍යාපාරය 2014/10/01 හදිසි ගිනිගැනීමකට භාජනය වූයේ නම්, එදින බේරාගත් තොගය රු. 10,000 ක් නම්, ගිනිගත් දින ගබඩාවේ තිබූ තොග සහ ගින්නෙන් විනාශ වූ තොගය වන්නේ,

	ගිනිගත් දින තිබූ තොගය	ගින්නෙන් විනාශ වූ තොගය
(1)	40,000	30,000
(2)	80,000	70,000
(3)	30,000	20,000
(4)	50,000	40,000
(5)	75,000	65,000

(......)

(17) සපුමල් විසින් 2012/04/01 දින නව ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2013/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සහ 2014/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ලාභ පෙන්නුම් කළ අතර 2015/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 150,000 ක අලාභයක් පෙන්නුම් කරන ලදී. ලාභ ලද වර්ෂ දෙකේදීම ඔහු ලාභය මුදලින් රැගෙන යන ලදී. සපුමල් පසුගිය වසර 03 ක කාලය තුළ දී අමතර ප්‍රාග්ධනය ලෙස රු. 100,000 ක් යොදවා ඇති අතර 2015/03/31 දිනට හිමිකම රු. 600,000 ක් විය.

ආරම්භයේ සිට මේ දක්වා ව්‍යාපාරයේ කිසිඳු වගකීමක් නොමැති නම් ව්‍යාපාරයේ ආරම්භය දී පැවති වත්කම් වල වටිනාකම කොපමණ ද?

(1) රු. 500,000 කි. (2) රු. 600,000 කි. (3) රු. 650,000 කි.

(4) රු. 750,000 කි. (5) රු. 800,000 කි. (......)

(18) සීමිත පැල්වත්ත සමාගම ඇසුරුම් කළ කිරි අලෙවි කරන සමාගමකි. 2015/03/31 දිනට පැවති ඇසුරුම් කළ කිරි වල පිරිවැය රු. 400,000 කි. මේ තුළ ඇසුරුම් කළ කිරි ගබඩා කිරීමේ පිරිවැය වූ රු. 50,000 ක් ද ඇතුළත් කර ඇත.

තවද පිරිවැය රු. 30,000 ක් වූ ඇසුරුම් කිරි වල කල් ඉකුත්වීමේ දිනය 2015/03/30 විය. මූල්‍යතත්ව ප්‍රකාශයේ තොගය ලෙස නිරූපණය කළ යුතු වටිනාකම වන්නේ,

(1) රු. 300,000 කි. (2) රු. 320,000 කි.

(3) රු. 350,000 කි. (4) රු. 370,000 කි.

(5) රු. 3,30,000 කි. (......)

(19) විමල් ව්‍යාපාරයකින් ඒකකයක් රු. 2,500 බැගින් ඒකක ප්‍රමාණයක් මිලදී ගන්නා ලදී. මෙහිදී ඔහුට 20% වෙළඳ වට්ටමක් ලද අතර, ණයමුදල පියවීමේදී 10% මුදල් වට්ටමක් ඔහුට ලැබුණි. ණය පියවීම සඳහා රු. 72,000 ක් ගෙවන ලදී. අවශ්‍ය වන්නේ විමල් ලද මුදල් වට්ටම සහ වෙළඳ වට්ටම කීයද?

	මුදල් වට්ටම	වෙළඳ වට්ටම
(1)	7,200	8,000
(2)	7,200	16,000
(3)	8,000	20,000
(4)	8,000	18,000
(5)	8,000	14,400

(......)

(20) 20150331 දිනට ව්‍යාපාර ආයතනයක මුළු වත්කම් රු. 800,000 ක් සහ මුළු වගකීම් රු. 300,000 ක් විය.

වර්ෂය තුළ පහත වැරදි සිදු වී තිබේ.

විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම් මත යවන ලද තොගයේ විකුණුම් මිල වන රු. 100,000 විකුණුම් ආදායම ලෙස හඳුනාගෙන තිබීම.

මාර්තු 31 වන විට මෙම තොගය අලෙවිකර නොමැති අතර ව්‍යාපාරය විකුණුම් මිලෙන් 25% ක ලාභයක් ලැබෙන පරිදි භාණ්ඩ අලෙවි කරයි.

2015 මාර්තු මාසයට අදාළ රු. 12,000 ක විදුලි බිල ගිණුම්ගත නොකිරීම.

ඉහත වැරදි නිවැරදි කළ පසු ව්‍යාපාරයේ නිවැරදි මුළු ස්කන්ධය කොපමණ ද?

(1) රු. 313,000 කි. (2) රු. 463,000 කි. (3) රු. 388,000 කි.

(4) රු. 488,000 කි. (5) රු. 537,000 කි. (......)

(21) ඉමන්දි සමාගම 2015/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙළ කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනයන් 2015/07/01 වන දින වනවිට විගණන ආයතනය විසින් විගණනය කර අවසන් විය. 2015/07/10 වැනි දින ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කළ අතර 2015/07/20 දින එම මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබුණි. 2015/07/30 දින මෙම මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කරන ලදී.

මෙම සිදුවීම සම්බන්ධව වාර්ථා කරන දිනයට පසු සිදුවීම් වලට අදාළ කාල සීමාව වන්නේ,

(1) 2015/03/31 සිට 2015/07/10 දක්වා කාලය.

(2) 2015/03/31 සිට 2015/07/01 දක්වා කාලය.

(3) 2015/03/31 සිට 2015/07/30 දක්වා කාලය.

(4) 2015/03/31 සිට 2015/07/20 දක්වා කාලය.

(5) 2015/03/31 සිට 2016/07/20 දක්වා කාලය. (......)

(22) පහත සඳහන් තොරතුරු සමාගමක කොටස් නිකුතුවට අදාළ වේ.

අයදුම්කළ කොටස් ගණන	4,000,000
කොටසක නිකුතු මිල	රු. 20
ප්‍රතික්ෂේප කළ කොටස් ගණන	400,000
විභාජනය කළ කොටස් ගණන (අතිරික්ත කොටස් සඳහා මුදල් ආපසු යවන ලදී.)	2,000,000
කොටස් නිකුතු වියදම්	රු. 1,000,000

මෙම කොටස් නිකුතු මඟින් සමාගමේ ශුද්ධ වත්කම්වලට ඇතිවන ශුද්ධ බලපෑම කොපමණ ද?

(1) රු. මිලියන 19 (2) රු. මිලියන 20 (3) රු. මිලියන 21

(4) රු. මිලියන 35 (5) රු. මිලියන 39 (......)

(23) ආයතනයක 2015/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

අමුද්‍රව්‍ය තොග	2014/04/01 දිනට	25,000
	2015/03/31 දිනට	20,000
අමුද්‍රව්‍ය මිලට ගැනීම්		80,000
පරිවර්ථන පිරිවැය		120,000
ඍජු ශ්‍රම පිරිවැය		30,000
පොදුකාර්ය පිරිවැය		90,000
2014/04/01 සිට 2015/03/31 දක්වා නොනිමි තොගයේ වැඩිවීම		30,000

2015/03/31 න් අවසන් වර්ෂය සඳහා මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

(1) රු. 205,000 (2) රු. 175,000 (3) රු. 200,000
(4) රු. 235,000 (5) රු. 240,000 (......)

(24) සීමිත මල්කි සමාගම තම නිෂ්පාදන කටයුතු පුළුල් කිරීම සඳහා විදෙස් රටකින් නව යන්ත්‍රයක් ආනයනය කරන ලදී. එහි ගැණුම් මිල රු. 750,000 වූ අතර ඊට අමතරව පහත වියදම් ද දරණ ලදී.

- නැව්ගාස්තු 50,000
- තීරුබදු 125,000
- නැවත ආයකරගත හැකිබදු 15,000
- ප්‍රවාහන ගාස්තු 5,000
- පළමු අත්හදා බැලීමේ පිරිවැය 10,000
- දෙවන අත්හදා බැලීමේ පිරිවැය 2,500

207,500

පළමු අත්හදා බැලීමේදී ලබාගත් නිෂ්පාදන අලෙවි කර රු. 5,000 ක් උපයා ගත් අතර දෙවන අත්හදා බැලීමෙන් ලබාගත් නිෂ්පාදන අලෙවි කොට රු. 2,000 ක් උපයා ගන්නා ලදී.

මෙම යන්ත්‍රයේ පිරිවැය ලෙස සටහන් කළ යුතු වන්නේ,

(1) රු. 750,000 කි. (2) රු. 935,000 කි. (3) රු. 940,000 කි.
(4) රු. 955,000 කි. (5) රු. 957,500 කි. (......)

(25) මූල්‍ය ප්‍රකාශනවල සීමාවන් වන්නේ,

A ගිණුම්කරණ ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතය.
B ගිණුම්කරණ ප්‍රමිතීන්හි අධි භාවිතය.
C ඓතිහාසික තොරතුරු මත පදනම්ව තීරණ ගැනීමේ අපහසුව.
D ඓතිහාසික පිරිවැය මගින් ව්‍යාපාරයේ සාධාරණ අගය නිරූපණය නොවීම.
E මූල්‍යමය නොවන තොරතුරු ඉදිරිපත් නොකිරීම.

(1) A, B හා D පමණි (2) A, C හා D පමණි (3) B හා D පමණි
(4) B, C හා D පමණි (5) A, B, C, D, E සියල්ලම. (......)

(26) පහත කුමන ප්‍රකාශ ජංගම වත්කම් සම්බන්ධයෙන් නිවැරදි වේද?

A ව්‍යාපාරයක සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ විකිණීමට හෝ පාරිභෝජනයට ඇති හෝ

B මූලික වශයෙන් වෙළඳ කටයුතු සඳහා පවත්වාගෙන යන වත්කම් හෝ

C වාර්තා කරන කාලච්ඡේදයෙන් පසු මාස 12 ක කාලයක් තුළ උපලබ්ධි වනු ඇතැයි අපේක්ෂිත හෝ

D මුදල් හා මුදල් සමාන දෑ

E අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබන දෑ වේ.

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා D පමණි

(4) A, B, C, D, E යන සියල්ලම (5) A, B, C හා D පමණි (......)

(27) පහත සඳහන් කුමන දෑ සමාගමක හිමිකමේ සංරචක ලෙස හඳුනාගනු ලබයි ද?

A රඳවාගත් ඉපැයුම්

B ප්‍රත්‍යාගණන සංචිත

C ගෙවිය යුතු අර්ථසාධක අරමුදල්

D පොදු සංචිත

E ක්ෂය වෙන්කිරීම්

(1) A හා B පමණි (2) A හා D පමණි (3) A, B හා D පමණි

(4) C හා E පමණි (5) A, B, C, D, E යන සියල්ලම (......)

(28) රන්කැට සමාගම 2015/03/31 දිනට මෝටර් රථ වටිනාකම රු. 950,000 කි. එදිනට ක්ෂය වෙන්කිරීම් රු. 325,000 කි. 2015/03/31 දින කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනයට අනුව මෝටර් රථ වටිනාකම රු. 875,000 කි. මෙම වාහන 2013/03/31 දින කරන ලද ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස රු. 175,000 ක අලාභයක් එම වර්ෂයේ දී රඳවාගත් ලාභයට භාර කර ඇත. 2015/03/31 දිනෙන් අවසන් වර්ෂයේ පිළියෙල කරන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම් වල හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ප්‍රත්‍යාගණන සංචිත තීරුවට ඇතුළත් කර ඇති නිවැරදි අගය වන්නේ,

	වෙනත් විස්තීර්ණ ආදායම් වලට ගන්නා අගය	ප්‍රත්‍යාගණන සංචිත වල ඇතුලත් අගය
(1)	250,000	250,000
(2)	175,000	175,000
(3)	250,000	75,000
(4)	75,000	75,000
(5)	375,000	250,000

(......)

(29) ''පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන'' සම්බන්ධ නිවැරදි ප්‍රකාශනය වන්නේ,

(1) කළමනාකරුවන්ගේ තීරණ ගැනීමේ අවශ්‍යතා වෙනුවෙන් පිළියෙල කරයි.

(2) පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, සංකල්ප ආදියට පටහැනිව පිළියෙළ කරනු ලබයි.

(3) අයිතිකරුවන්ගේ අවශ්‍යතාවය මත පිළියෙළ කරනු ලබයි.

(4) ගිණුම්කරණ තොරතුරු තමන්ටම ලබාගත නොහැකි පාර්ශවයන්ගේ විවිධ අවශ්‍යතා සැපරීමට පිළියෙල කරනු ලබයි.

(5) සමාජයේ පොදු යහපත උදෙසා සුභසාධන පරමාර්ථයෙන් පිළියෙළ කරයි. (......)

(30) තාරක, චාරුක හා චරිත සමසමව ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක නියුතු ව සිටි අතර 2014/04/01 දින චරිත හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. චරිත විශ්‍රාම ගැනීමේදී හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 600,000 කට අගය කළ අතර එය හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම තුළින් ගැලපීමට එකග විය. එමෙන්ම චරිත විශ්‍රාම ගැනීමේදී ඔහුට ගෙවිය යුතු හිමිකම නිරවුල් නොකොට ව්‍යාපාරයේ ණයක් ලෙස රඳවා ගැනීමට එකග විය. චරිත විශ්‍රාම ගැනීමෙන් පසු තාරක හා චාරුක 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගැනීමට එකග වන ලදී. 2015/03/31 දිනට පහත ශේෂ පැවතුණි,

	රු. 000
ප්‍රාග්ධන ගිණුම චරිත (කීර්තිනාමය ගැලපීමට පෙර)	600
ජංගම ගිණුම චරිත	(300)

2015/03/31 න් අවසන් වර්ෂය සඳහා චරිතයට ගෙවිය යුතු ණය පොළිය කීයද?

(1) රු. 20,000 කි. (2) රු. 25,000 කි. (3) රු. 30,000 කි.
(4) රු. 35,000 කි. (5) රු. 50,000 කි. (......)

- **අංක 31 සිට 50 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

(31) පහත එකිනෙක ගිණුම් කුමන ගිණුම්කරණ මූලිකාංගයට අයත් වන්නේ ද යන්න දක්වන්න.

A ආදායම් බදු වෙන් කිරීම ....

B ගැණුම් ....

C ක්ෂය වෙන්කිරීම් ....

D ගැනිලි ....

(32) පහත සඳහන් ක්ෂේත්‍රවලට අදාළව කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස්කම් ලියා දක්වන්න.

ක්ෂේත්‍රය	කළමනාකරණ ගිණුම්කරණය	මූල්‍ය ගිණුම්කරණය
(1) අවධානයට යොමුවන කාලය	....	....
(2) වාර්තා කිරීමේ වාර ගණන	....	....
(3) භාවිතාකරන පාර්ශවය	....	....
(4) පොදුවේ පිළිගත් මූලධර්ම	....	....

(33) සාමාන්‍ය කොටස් හා වරණීය කොටස් අතර ප්‍රධාන වෙනස්කම් 02 ක් සඳහන් කරන්න.

....
....
....
....

(34) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක 2014/04/01 දිනට සමුච්චිත අරමුදල රු. 500,000 ක් විය. මෙහි සාමාජිකයන් 100 දෙනෙකු 2014/15 වර්ෂය තුළ සිටි අතර එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 200 ක් විය. 2014/15 වර්ෂය සඳහා සාමාජික මුදල් හැර රු. 60,000 ක ආදායමක් පැවති අතර 2014/15 වර්ෂය සඳහා සංවිධානයේ වියදම රු. 100,000 ක් විය. වර්ෂය තුළ සමුච්චිත අරමුදලට බලපාන ගණුදෙනුවක් සිදු නොවූයේ නම් 2015/03/31 දිනට සමුච්චිත අරමුදල කීයද?

....

(35) ගංවතුර හේතුවෙන් 2015/03/31 දිනට ආසිරි ව්‍යාපාරයේ පැවති තොගයෙන් කොටසක් විනාශ විය. එදිනට බේරාගත් තොගයේ පිරිවැය රු. 80,000 ක් විය. පහත තොරතුරු ආසිරි ව්‍යාපාරයේ 2015/03/31 දිනෙන් අවසන් වන වර්ෂයට අදාළ වේ.

2014/03/31 දිනට තොගය		රු.	180,000
ගැනුම්		රු.	900,000
විකුණුම්	අත්පිට	රු.	500,000
	ණයට	රු.	700,000

ව්‍යාපාරය පිරිවැය මත 25% ක දළ ලාභ අනුපාතයක් රඳවා ගනී. ගින්නෙන් විනාශ වූ තොගයේ පිරිවැය කීය ද?

....

(36) මුදල් පොතට අනුව බැංකු ශේෂය හා බැංකු ප්‍රකාශනයට අනුව බැංකු ශේෂය එකිනෙකට අසමාන වීමට බලපාන පහත කරුණු නිසා මුදල් පොතට අනුව බැංකු ශේෂය, බැංකු ප්‍රකාශනයේ ශේෂයට සාපේක්ෂව අඩුවේ ද හෝ වැඩිවේද යන්න දක්වන්න.

අඩුවේ / වැඩිවේ

A ඉදිරිපත් නොවූ චෙක්පත් ....

B නිශ්කාශනය නොවූ චෙක්පත් ....

C මුදල් පොතේ වාර්තා නොවූ බැංකු ගාස්තු ....

D මුදල් පොතේ වාර්තා නොවූ ණයගැති සෘජු ප්‍රේෂණ ....

(37) පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද නැතිනම් අසත්‍ය ද යන්න දක්වන්න.

A අවසන් තොගය හා විකුණුම් පිරිවැය අතර අනුලෝම සම්බන්ධයක් පවතී. ....

B ආරම්භක තොගය හා දළ ලාභය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතී. ....

C තොගයක පිරිවැය සැමවිටම ශුද්ධ උපලබ්ධි අගයට වඩා අඩු වේ. ....

D තොගයක පිරිවැයට වඩා ශුද්ධ උපලබ්ධි අගය වැඩි වූ විට පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය අතර වෙනස ලාභයක් ලෙස හඳුනාගත යුතුය. ....

(38) අමල්, නිමල් හා සිසිල් පිළිවෙලට 4:3:2 අනුපාතයට ලාභ ලාභ බෙදාගනිමින් පවත්වාගෙන ආ හවුල් ව්‍යාපාරයෙන් 2015/03/31 දින සිසිල් විශ්‍රාම ගනී.

විශ්‍රාම ගැනීමේ ගැලපීම් කිසිවක් කිරීමට පෙර 2014/04/01 දිනට සිසිල්ගේ ප්‍රාග්ධන ගිණුමේ බැර ශේෂය හා ජංගම ගිණුමේ හර ශේෂය පිළිවෙලින් රු. 300,000 හා 50,000 ක් විය.

විශ්‍රාම ගැනීමේ දී සිසිල් පවරාගත් ලී බඩු වල පිරිවැය, සමුච්චිත ක්ෂය හා පවරාගත් වටිනාකම පිළිවෙලින් රු. 90,000, රු. 30,000 ක් හා රු. 40,000 ක් වේ.

ව්‍යාපාරය විසින් තවදුරටත් ගෙවිය යුතු සිසිල්ගේ හිමිකම කොපමණ ද?

....

(39) හවුල්කරුවෙකු ලෙස හවුල් ව්‍යාපාරයකට දායකත්වය ලබාදිය හැකි ප්‍රධාන ආකාර 03 ක් නම්කර එම දායකවීම් වලට ලැබෙන ප්‍රතිලාභ ඒ ඒ දායකවීම ඉදිරියෙන් ලියන්න.

....

....

....

(40) බොල් ණය හා අඩමාන ණය අතර ඇති සමානකම් 03 ක් දක්වන්න.

....

....

....

....

....

(41) රු. 1,000,000 කට අත්පත්කරගෙන තිබූ සහ 2014/03/31 දින පළමුවන වතාවට ප්‍රත්‍යාගණනය කර තිබූ ඉඩමක් 2015/03/31 දින නැවත ප්‍රත්‍යාගණනය කරන ලදී. දෙවන ප්‍රත්‍යාගණනය නිසා ඉඩමේ ධාරණ වටිනාකම රු. 1,200,000 ක් වූ අතර, දෙවන ප්‍රත්‍යාගණනයෙන් ජනනය වූ අතිරික්තය රු. 500,000 කි.

- ප්‍රථම වතාවට මෙම ඉඩම ප්‍රත්‍යාගණනය කළ අගය කුමක් ද? ....
- දෙවන ප්‍රත්‍යාගණනයෙන් පසු 2015/03/31 දිනට ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය කුමක් ද?

  ....

(42) පහත සඳහන් තොරතුරු වලට අනුව 2015/03/31 දිනට කල්බදු ගැණුම්කරුගේ පොත්වල හඳුනාගත යුතු කල්බදු වත්කමේ ධාරණ අගය කොපමණ ද?

කල්බදු වර්ගය	මූල්‍ය
කල්බදු ගිවිසුම් දිනය	2014/03/31
කල්බදු කාලය	වර්ෂ 08
වාර්ෂික කල්බදු වාරිකය	රු. 1,600,000
2014/03/31 දිනට අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය	රු. 3,000,000
20145/03/31 දිනට එහි වෙළඳපොළ මිළ	රු. 3,600,000

....

(43) 2014/04/01 දින රු. 125,000 ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කර පළමු වර්ෂය තුළ දී රු. 150,000 ක ලාභයක් උපයන ලද අතර 2015/03/31 දිනට ව්‍යාපාරය සතුව රු. 15,000 ක මුදලක් පමණක් ඉතිරි වී තිබීම දැක ව්‍යාපාරයේ අයිතිකරු පුදුමයට පත් වී සිටී. මෙම තත්වයට බලපෑ හැකි හේතු දෙකක් දක්වන්න.

....

....

(44) සුළු මුදල් ප්‍රතිපූර්ණය කරන දිනයේ දී ආයතනයක සුළු මුදල් භාරකරු සතුව රු. 1,500 ක් තිබුණි. අයිතිකරුට ලබාදුන් රු. 500 ක වැටුප් අත්තිකාරම් ද සහිතව, මෙම කාලය තුළදී ඔහු රු. 4,500 ක එකතුවක් වන පරිදි ගෙවීම් සිදුකර තිබුණි.

(1) සුළු මුදල් අග්‍රිමය කොපමණ ද? ....

(2) එම දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කොපමණ ද? ....

(45) සමාගමක පහත තොරතුරු ලබා දී ඇත.

2010/04/01 ට ණයගැති පාලන ගිණුමේ ශේෂය	140,000
ණයගැතියන්ගෙන් එකතු කළ මුදල්	635,000
ණයට විකුණුම්	595,000
2011/03/31 ට අඩමාණ ණය සඳහා වෙන්කිරීම්	15,000

2011/03/31 දිනට ණයගැති පාලක ගිණුමේ ශේෂය ....

(46) පහත දී ඇති තොරතුරු භාවිත කරමින් සමන් ට්‍රේඩර්ස්හි 2010/04/01 දිනට ශුද්ධ වත්කම්වල වටිනාකම ගණනය කරන්න.

2011/03/31 ට ශුද්ධ වත්කම්	840,000
වර්ෂයේ ලාභය	210,000
වර්ෂය තුළදී අයිතිකරු විසින් කළ මුදල් ගැනිලි	120,000
ගිණුම්ගත නොකළ වර්ෂය තුළ දී අයිතිකරු විසින් සිදු කළ භාණ්ඩ ගැනිලි පිරිවැය	10,000

2010/04/01 දිනට ශුද්ධ වත්කම් : ....

(47) සාමාන්‍ය තත්ත්වය යටතේ පොදු ජ'නලයක් තුළ වාර්තාගත වන ගණුදෙනු වන්නේ,

A රු. 800,000 කට යන්ත්‍රයක් ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා ගැනීම.

B නැවත විකිණීමේ අරමුණින් රු. 50,000 භාණ්ඩ තොගයක් ණයට ගැනීම.

C උපචිතව තිබූ විදුලිය රු. 15,000 ක් මුදලින් ගෙවීම.

D ණයගැතියන්ගෙන් රු. 18,000 ක් බොල් ණය කපාහැරීම.

E ප්‍රචාරණ ගිණුමේ පවතින රු. 45,000 ක් ලාභාලාභ ගිණුමට ගෙන යාම.

F අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 20,000 ක් සටහන් කිරීම.

....

(48) තනි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර වල ගිණුම් තැබීම අනිවාර්ය කර නැතත් සමාගම් හා රාජ්‍ය සංස්ථාවල ගිණුම් තැබීම අනිවාර්ය කර ඇත්තේ ඇයි?

....

....

(49) පහත සඳහන් ගණුදෙනුවලට අදාළව මූලික ලියවිල්ල, උපයෝගී පොත, ද්විත්ව සටහන සැලකිල්ලට ගෙන නිවැරදි ගණුදෙනුවල අක්ෂර ලියන්න.

අංක	ගණුදෙනුව	මූලික සාක්ෂිය	උපයෝගී පොත	ද්විත්ව සටහන
A	ආපසු එවුම්	බැරපත	ආපසු එවුම් ජ'නලය	ආපසු එවුම් හර ණයගැතියෝ බැර
B	ස්ථාවර වත්කම් ක්ෂය කිරීම	ජ'නල් වවුචරය	පොදු ජ'නලය	ක්ෂය ගිණුම හර ක්ෂය වෙන්කිරීම බැර
C	VAT බදු මුදල් යැවීම	ජ'නල් වවුචරය	පොදු ජ'නලය	VAT හර මුදල් බැර
D	සේවක අර්ථසාධක සේවක දායකත්වය	ගෙවීම් වවුචරය	මුදල් පොත	අර්ථ සාධක අරමුදල් හර මුදල් බැර

....

(50) නාලක ව්‍යාපාරයේ 2015/12/31 න් අවසන් වූ වර්ෂයේ පහත තොරතුරු අනාවරණය කරයි.

(1)	අත්පිට විකුණුම්		රු.	400,000
(2)	ණයගැතියන්ගෙන් ලද මුදල්	2014 විකුණුම්වලින්	රු.	250,000
		2015 විකුණුම්වලින්	රු.	300,000
(3)	2016 සඳහා ලද විකුණුම් අත්තිකාරම් මුදල්		රු.	50,000
(4)	2015 වර්ෂයේ ණයට විකුණුම්		රු.	500,000
(5)	2014 දී කපාහල බොල් ණයක් 2015 නැවත ලැබීම ඉහත ණයගැති ලැබීම් තුළ ඇතුළත්ව නැත.		රු.	10,000

අවශ්‍ය වන්නේ,

මුදල් පදනම යටතේ සහ උපචිත පදනම යටතේ 2015 විකුණුම් ලෙසට ගනු ලබන වටිනාකම කුමක් ද?

....